WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

කෘෂි හා ආහාර තාක්ෂණය	I, II	පැය තුනයි
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும்	I, II	மூன்று மணித்தியாலம்
Agriculture and Food Technology	I, II	Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

කෘෂි හා ආහාර තාක්ෂණය I

උපදෙස්:

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඉතිහාසය අනුව මානව ශිෂ්ටාචාරය විකාශය වීමේදී පසු කළ යුග අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) ගොවි යුගය, දඩයම් යුගය, එඬේර යුගය
(2) එඬේර යුගය, ගොවි යුගය, දඩයම් යුගය
(3) දඩයම් යුගය, එඬේර යුගය, ගොවි යුගය
(4) එඬේර යුගය, දඩයම් යුගය, ගොවි යුගය

2. අවුරුද්දේ කුමන කාලයක වගා කළත් නියමිත වයසේදී ම පීදීම සිදු වන බෝග අයත් වන්නේ,
(1) කෙටි දින බෝග කාණ්ඩයට ය.
(2) දිගු දින බෝග කාණ්ඩයට ය.
(3) ප්‍රභා අවධි සංවේදී බෝග කාණ්ඩයට ය.
(4) දින උදාසීන බෝග කාණ්ඩයට ය.

3. පාසල් වත්තේ සවිකර ඇති සුළං දිශා දර්ශකයක ඊ හිස, ඊසාන දිශාවට යොමු වී ඇත්නම් එම අවස්ථාවේ සුළං හමන දිශාව වන්නේ,
(1) ඊසාන සිට නිරිත දෙසට ය.
(2) නිරිත සිට ඊසාන දෙසට ය.
(3) වයඹ සිට ගිනිකොන දෙසට ය.
(4) ගිනිකොන සිට වයඹ දෙසට ය.

4. පහත දැක්වෙන ප්‍රකාශ අධ්‍යයනය කරන්න.
A - වර්ෂාපතනයේ ප්‍රමාණය හා ව්‍යාප්තිය අනුව ශ්‍රී ලංකාව තෙත්, අතරමැදි හා වියළි වශයෙන් ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදා ඇත.
B - තෙත් කලාපයට ප්‍රධාන වශයෙන් නිරිත දිග මෝසම් සුළඟින් ද, වියළි කලාපයට ප්‍රධාන වශයෙන් ඊසාන දිග මෝසම් සුළඟින් ද වර්ෂාව ලැබේ.
C - නිරිත දිග මෝසම් සුළං වර්ෂාවෙන් පමණක් වගා කරන කාලය 'මහ කන්නය' වශයෙන් ද ඊසාන දිග මෝසම් සුළං වර්ෂාවෙන් පමණක් වගා කරන කාලය 'යල කන්නය' වශයෙන් ද හැඳින්වෙයි.

මෙම ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) A, B හා C යන සියල්ල ම ය.

5. මල් පෝච්චියක පස් පුරවා එම පස් ජලයෙන් සංතෘප්ත කර අතිරික්ත ජලය බැස ගිය පසු එම පෝච්චියේ අඩංගු පසෙහි තිබිය හැක්කේ,
(1) ගුරුත්වාකර්ෂණ ජලය පමණි.
(2) ජලාකර්ෂක ජලය පමණි.
(3) ගුරුත්වාකර්ෂණ හා කේශාකර්ෂණ ජලය පමණි.
(4) කේශාකර්ෂණ හා ජලාකර්ෂක ජලය පමණි.

6. පස් සාම්පලයක් ගෙන, වාතයේ වියළා මිලි මීටර 2 සිදුරු සහිත පෙනේරයකින් හැලූ විට පෙනේරයෙහි ඉතිරි වන්නේ,
(1) රළු වැලි ය.
(2) බොරළු ය.
(3) රළු වැලි හා සියුම් වැලි ය.
(4) රළු වැලි හා බොරළු ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

7. pH අගය 5ක් වූ පසක් බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කිරීමට පසට එකතු කළ යුතු ද්‍රව්‍යය වනුයේ,
(1) ඩොලමයිට් ය.
(2) ගෙන්දගම් ය.
(3) මැටි ය.
(4) රොක් පොස්පේට් ය.

8. පස සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - පසේ අඩංගු ඛනිජ ද්‍රව්‍යවල සාපේක්ෂ ප්‍රමාණය මත එම පසේ වයනය තීරණය වෙයි.
B - පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම මගින් පසේ කැටායන හුවමාරු ධාරිතාව අඩු වෙයි.
C - පසේ කැටිති ව්‍යූහය බෝග වගාවට හිතකර ය.
මෙම ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) B සහ C පමණි.
(4) A, B හා C යන සියල්ල ම ය.

9. පාෂාණවල භෞතික ජීරණය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන සාධක පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) උෂ්ණත්වය වෙනස් වීම, ජලය මිදීම, කැටායන හුවමාරුව හා ශාක මුල්
(2) සත්ත්ව ක්‍රියා, කාබන් ඩයොක්සයිඩ්, ක්ෂුද්‍ර ජීවී ක්‍රියා හා ග්ලැසියර්
(3) ගලා යන ජලය, රැලි ක්‍රියා, කාබන් ඩයොක්සයිඩ් හා ජලය මිදීම
(4) ගලා යන ජලය, උෂ්ණත්වය වෙනස් වීම, සුළඟ හා රැලි ක්‍රියා

10. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පස ආම්ලික වීමට බලපාන ප්‍රධාන හේතුව කුමක් ද?
(1) පසට යූරියා පොහොර නිතර යෙදීම
(2) එක ම ගැඹුරකට වැඩි වාර ගණනක් පස පෙරළීම
(3) පසේ ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය වැඩි වීම
(4) පසේ ඇති භාස්මික අයන වර්ෂා ජලයෙන් සේදී යාම

11. දී ඇති රූපසටහනේ දැක්වෙන බිම් සකස් කිරීමේ උපකරණය මගින් සිදු කරනු ලබන්නේ,
(1) පස කැපීම ය.
(2) පස කැපීම හා පෙරළීම ය.
(3) පස පෙරළීම හා කැට පොඩි කිරීම ය.
(4) කැට පොඩි කිරීම හා සමතලා කිරීම ය.

12. ඩැපොග් තවානක බීජ පැළ ගලවා සිටුවිය යුත්තේ තවාන් දමා දින,
(1) 6 - 8 වයසේදී ය.
(2) 10 - 12 වයසේදී ය.
(3) 15 - 16 වයසේදී ය.
(4) 17 - 19 වයසේදී ය.

● අංක 13 හා 14 ප්‍රශ්නවලට පිළිතුරු දීමට පාංශු තෙතමන මට්ටම් දැක්වෙන පහත දී ඇති සටහන උපයෝගී කර ගන්න.

13. බෝග වගාව සඳහා ප්‍රශස්ත පාංශු තෙතමන මට්ටම කුමක් ද?
(1) A (2) B (3) C (4) D

14. බෝග වගාවේදී ප්‍රායෝගික ව ජල සම්පාදනය කළ යුතු යැයි සැලකෙන පාංශු තෙතමන මට්ටම පවතින්නේ,
(1) A හා B අතර ය.
(2) A හා C අතර ය.
(3) B හා C අතර ය.
(4) C හා D අතර ය.

15. ශාකවලට අත්‍යවශ්‍ය මහා පෝෂකයක් අඩංගු, රතු දුඹුරු පැහැති ස්ඵටික ලෙස පවතින, ජලයේ හොඳින් දිය වන රසායනික පොහොර වර්ගය කුමක් ද?
(1) මියුරියේට් ඔෆ් පොටෑෂ්
(2) ත්‍රිත්ව සුපර් පොස්පේට්
(3) යූරියා
(4) රොක් පොස්පේට්

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

16. ගෙවතු වගාවක ඇති මිරිස් බෝගයකට රසායනික පොහොර යෙදීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය කුමක් ද?
(1) වගා භූමියට ඉසීම (2) එක් එක් පැළය වටා යෙදීම
(3) පැළ පේළි අතරට යෙදීම (4) වගා බිමේ තැනින් තැන වළවල් හාරා යෙදීම

17. ආක්‍රමණශීලී වල් පැළෑටි පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) මොනර කුඩුම්බිය හා ගඳපාන (2) බටදැල්ල හා ඇටවරා
(3) තුනැස්ස හා කුඩමැට්ට (4) පාතීනියම් හා විඩේලියා

18. බණ්ඩක්කා වගාවක පත්‍ර නාරටි කහ පැහැයෙන් ද නාරටි අතර කොළ පැහැයෙන් ද යුක්ත ව තිබූ අතර ඇතැම් පත්‍ර විකෘති වී, කුඩා වී තිබුණි. මෙයට හේතුව විය හැක්කේ,
(1) වෛරසයකි. (2) බැක්ටීරියාවකි. (3) දිලීරයකි. (4) වට පණුවෙකි.

19. වී වගාවට හානි පමුණුවන දුඹුරු පැළ කීඩෑවා හා එම හානිය පිළිබඳ ව **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) මෙම කෘමියා අර්ධ රූපාන්තරණය දක්වයි.
(2) මෙම කෘමියා වී ශාකයේ පටක විද යුෂ උරා බොයි.
(3) ශිඝ්‍ර අවධියේදී පමණක් හානි කරයි.
(4) හානිය පිළිස්සුණු ස්වභාවයක් ඇති වෘත්තාකාර ප්‍රදේශ ලෙස දිස් වේ.

20. වී ශාකය අයත් කුලය කුමක් ද?
(1) කුකර්බිටේසියේ (Cucurbitaceae) (2) පොඒසියේ (Poaceae)
(3) සොලනේසියේ (Solanaceae) (4) මැල්වේසියේ (Malvaceae)

21. අපිභෞම ප්‍රරෝහණය පෙන්නුම් කරන බීජ පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) වී හා මුං (2) මිරිස් හා බටු
(3) කඩල හා බඩ ඉරිඟු (4) වී හා බෝංචි

22. බෝංචි බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීම සඳහා යොදාගත් බීජ සංඛ්‍යාව 50ක් වූ අතර, එයින් ප්‍රරෝහණය වූ බීජ සංඛ්‍යාව 46කි. එම බීජ සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය කීය ද?
(1) 46% (2) 82% (3) 92% (4) 98%

23. අංකුර බද්ධයේදී ග්‍රාහකය ලෙස යොදා ගැනීමට සුදුසු අඹ ප්‍රභේදයක් වන්නේ,
(1) විලාඩ් ය. (2) කොහු අඹ ය.
(3) කර්තකොළොම්බන් ය. (4) වෙල්ලෙයි කොළොම්බන් ය.

24. ශාක අතු බැඳීමේදී, තෝරා ගනු ලබන අත්තෙහි පොතු වලයක් ඉවත් කිරීමෙන් මුල් ඇදීම උත්තේජනය කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී වැදගත් වන්නේ ශාකයේ කුමන පටකයක්/පටක ඉවත්වීම ද?
(1) ශෛලම පටකය (2) ප්ලෝයම පටකය
(3) කැම්බියම් පටකය (4) ශෛලම හා කැම්බියම් පටකය

25. බෝග වගාවේදී භාවිත කරනු ලබන ඇතැම් පොලිතීන් ගෘහ තුළ ඇති සැකසුම් කිහිපයක් පහත දැක්වේ.
A - වහලයේ මුදුන මට්ටම් දෙකකට සැකසීම
B - පැති බිත්තිවල පිටවුම් පංකා සවි කිරීම
C - පැති බිත්තිවලට පාරජම්බුල කිරණ සඳහා ප්‍රතිරෝධී පොලිතීන් යෙදීම

මේවායින් පොලිතීන් ගෘහයේ උෂ්ණත්වය පාලනය සඳහා දායක වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි.
(3) A සහ C පමණි. (4) A, B හා C යන සියල්ල ම ය.

26. බීජ වර්ගය සහ එහි සුප්තතාවට හේතුව නිවැරදි ව දැක්වෙන වරණය පහත වගුවෙන් තෝරන්න.

	බීජ වර්ගය	සුප්තතාවට හේතුව
(1)	වී	අපාරගම්‍ය බීජාවරණයක් තිබීම
(2)	තක්කාලි	නිශේධක ද්‍රව්‍ය තිබීම
(3)	අඹ	නොමේරූ කලලයක් තිබීම
(4)	ඕකිඩ්	ඝන බීජාවරණයක් තිබීම

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

27. බෝගයක වර්ධක වර්ධනය අවසන් වී ප්‍රජනක වර්ධනය ආරම්භ වන විට තවත් බෝගයක් එම ක්ෂේත්‍රයේ ම සංස්ථාපනය කරන බෝග වගා රටාව හඳුන්වන්නේ,

(1) බෝග මාරුව ලෙස ය. (2) මිශ්‍ර බෝග වගාව ලෙස ය.
(3) අතුරු බෝග වගාව ලෙස ය. (4) කඩින් කඩ වගාව ලෙස ය.

28. පරිණත අවධියට පසු ව අස්වනු නෙළීම නිසා තන්තුමය ස්වභාවය වැඩි වී ආහාර රුචිය අඩු වීමට ලක් වන බෝග වන්නේ,

(1) කෙසෙල් හා පේර ය. (2) පැපොල් හා අඹ ය.
(3) දඹල හා බෝංචි ය. (4) මිරිස් හා තක්කාලි ය.

29. රක්තහීනතාවට බලපාන්නේ කුමන විටමින් වර්ගයේ ඌනතාවක් ද?

(1) A (2) B_{12} (3) D (4) K

30. 'ඇෆ්ලටොක්සින්' අඩංගු විය හැකි ආහාරයක් වන්නේ,

(1) හොඳින් නොතැම්බූ මස් ය. (2) පුස් සහිත රට කජු ය.
(3) කල් ඉකුත් වූ බිත්තර ය. (4) තැලීමට භාජන වූ පලතුරු ය.

31. සාන්ද්‍රීකරණය මගින් කල් තබා ගන්නා ආහාරයකි,

(1) කල් කිරි. (2) ලුණු දෙහි. (3) චීස්. (4) කරවල.

32. කෝඩියල් නිෂ්පාදනයේදී අනුමත ප්‍රමාණවලින් යොදන නිර්දේශිත පරිරක්ෂක ද්‍රව්‍යයක් වන්නේ,

(1) සෝඩියම් නයිට්රේට් ය. (2) ලැක්ටික් ඇසිඩ් ය.
(3) ඇසිටික් ඇසිඩ් ය. (4) සෝඩියම් මෙටාබයිසල්ෆයිට් ය.

33. කිරි ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කරන යුරෝපීය ගව වර්ග පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) සින්දි හා සහිවාල් (2) ෆ්‍රීෂියන් හා අයර්ෂයර්
(3) මුරා හා සූර්ති (4) ජර්සි හා නිලිරවි

34. සතාට අවශ්‍ය ජලය, ආහාර සහ සියලු පහසුකම් ලබාදෙමින් පූර්ණකාලීන ව ගවයින් නිවාස තුළ ඇති කිරීම හඳුන්වන්නේ,

(1) නිදැලි ක්‍රමය යනුවෙනි. (2) අඩ සියුම් ක්‍රමය යනුවෙනි.
(3) සියුම් ක්‍රමය යනුවෙනි. (4) නිදහස් ක්‍රමය යනුවෙනි.

35. කැල්සියම් ඌනතාව නිසා ගවයින්ට වැළඳෙන රෝගය කුමක් ද?

(1) කිරි උණ (2) කාල ගාත්‍රා රෝගය
(3) බුරුළු ප්‍රදාහය (4) බඩ පිපුම

36. වාණිජ මට්ටමින් කුකුළන් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බහුල ව භාවිත කරන ක්‍රමය කුමක් ද?

(1) ඝන ආස්තරණ ක්‍රමය (2) නිදැලි ක්‍රමය
(3) කට්ටු ක්‍රමය (4) කූඩු ක්‍රමය

37. ප්‍රෝටසෝවා මගින් කුකුළන්ට වැළඳෙන රෝගයක් වනුයේ,

(1) පුල්ලෝරම් ය. (2) රැනිකට් ය.
(3) කොක්සිඩියෝසිස් ය. (4) ගම්බෝරෝ ය.

38. සත්ත්ව ආහාර සලාක සැකසීමේදී ප්‍රෝටීන් ලබා දීම සඳහා භාවිත කළ හැකි ආහාර සංඝටකයකි,

(1) බඩ ඉරිඟු. (2) සිප්පි කටු (3) සෝයා අන්නය. (4) මෝර තෙල්.

39. බහු ආස්තර ඇසුරුමක් වන ටෙට්‍රාපැක් ඇසුරුම්වල බහා පාරිභෝගිකයා වෙත සපයනු ලබන ආහාරයක් වනුයේ,

(1) අයිස්ක්‍රීම් ය. (2) පලතුරු යුෂ ය. (3) චීස් ය. (4) පොල්තෙල් ය.

40. ආහාර ප්‍රමිතිකරණය පිළිබඳ ව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - SLS යනු ජාතික මට්ටමේ ප්‍රමිතියකි.
B - ISO යනු ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියකි.
C - ප්‍රමිතිකරණය මගින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු වේ.

මෙම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) B සහ C පමණි. (4) A, B හා C යන සියල්ල ම ය.

**

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...